12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-11-22 |

පැමිණිලි පාර්ශවය : පූජ්‍ය වැගම බේමසාර හිමි,
ශ්‍රී පඤ්ඤානන්ද මහ පිරිවෙන,
නාගහවත්ත පාර, මහරගම.

වගඋත්තර පාර්ශවය : 01. අධ්‍යාපනපති උපාධි සම්බන්ධිකාරකතුමිය,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

02. සම්බන්ධීකාරක,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

<u>පැමිණිලි අංකය : HRC/1149/16</u>

**පැමිණිලිකරු ඉදිරිපත් කරන කරුණු කෙටියෙන් :**

ඉහත පැමිණිලිකාර ස්වාමින් වහන්සේ විසින් මෙම පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වන අධ්‍යාපනපති උපාධිය සඳහා ඉල්ලුම් කළ නමුත්, ඒ සඳහා පවත්වනු ලබන බඳවා ගැනීමේ පරීක්ෂණයට ඉදිරිපත්වීමට තමාට අවස්ථාව නොදුන් බවයි. කොළඹ විශ්ව විද්‍යාලය විසින් අයදුම්කරුවන් වෙත නිකුත් කර තිබූ දැන්වීමේ සුදුසුකම් වශයෙන්,

පළමුවන වර්ගය කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී (පළමුපෙළ/ දෙවන පෙළ) උපාධි සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව විශිෂ්ඨ හෝ සම්මාන සමාර්ථයක් සහිතව සමත් වීම

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයකින් හා ඒ සමාන සුදුසුකම් සපුරා තිබීම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දෙවන වර්ගය කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණයේදී වෘත්තිය විෂයයන් සඳහා අවම වශයෙන් ඒ සහ බී ශ්‍රේණියේ සමාර්ථ සම්මාන 06 ක් සහිතව උපාධිය සමත්ව තිබීම

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත්ව කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විභාගයේදී අවම වශයෙන් ඒ හෝ බී ශ්‍රේණියේ සමාර්ථ 06 ක් සමත්වී තිබීම යන සුදුසුකම් දක්වා තිබූ බවයි.

තමා විසින් මේ සඳහා අයදුම් කර තිබුනේ ජාතික අධ්‍යාපන ආයතනයේ පවත්වන ලද ඩිප්ලෝමා සහතිකයක් මත බවත්, එම ඩිප්ලෝමාව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් වශයෙන් පිළිගත්තා බවට දන්වා තිබියදී තමා හට අදාළ විභාගයට පෙනීසිටීමට අවසරපත් නොදීම තුලින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් කොමිෂන් සභාව වෙත වාර්තාවක් එවා ඇති අතර, එහි සඳහන් කර ඇත්තේ, මෙම පීඨයේ අධ්‍යාපනපති පාඨමාලාවකට බඳවා ගනු ලබන්නේ පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හදාරා ඇති අයෙකු පමණක් බවත්, ඒ බව පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති බවත්ය. එහි පිටපතක් කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. අයදුම්කරු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනයෙන් වන අතර, එය පිළිගත් විශ්ව විද්‍යාලයක් නොවන බැවින් එම සහතිකය මෙම පාඨමාලාවට ඇතුලත් කර ගැනීමට සුදුසුකමක් ලෙස පිළිනොගන්නා බව දක්වා ඇත. එබැවින් අයදුම්කරු පිළිගත් විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත්නම් පමණක් අදාළ පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සලකා බැලීමට හැකි බව සඳහන් කර ඇත.

කොළඹ විශ්ව විද්‍යාලය විසින් නිකුත් කර ඇති පුවත්පත් දැන්වීමේ ප්‍රවේශ සුදුසුකම් පළමු වර්ගයේ සඳහන් කර ඇති පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම යන කරුණ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ගෙන් විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී පළමු පෙළ, දෙවන පෙළ උපාධි සහතිකය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි සහතිකයක් කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව විශිෂ්ඨ හෝ සම්මාන සමාර්ථ සහිතව සමත්වීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම යනුවෙන් සඳහන් කර ඇත්තේ, කොළඹ විශ්ව විද්‍යාලයේ නොවන වෙනත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම (කොළඹ විශ්ව විද්‍යාලය හැර වෙනත් විශ්ව විද්‍යාලයකින්) උපාධියක් හෝ ඉහත දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතු බවයි.

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවරය :-**

මෙම පැමිණිල්ලට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් වාර්තාවක් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කැඳවන ලද අතර, 2017.02.06 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අත්සනින් නිකුත් කර ඇති වාර්තාවේ සඳහන් කර ඇත්තේ, ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමන අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමන පශ්චාත් උපාධි පාඨමාලාවක් හා සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන බවයි.

**නිරීක්ෂණ හා නිගමනය :-**

ඉහත පැමිණිල්ලට අදාලව ඉදිරිපත් වී ඇති කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාර හිමිනම මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා ඇති බවත්, එය විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සේ සලකා කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වන පශ්චාත් අධ්‍යාපනපති උපාධියට බඳවා ගන්නා ලෙස ඉල්ලා ඇත.

වගඋත්තරකරුවන් එය ප්‍රතික්ෂේප කර ඇති අතර, මූල් අවස්ථාවේදීම පුවත්පත් දැන්වීම පළ කිරීමේදී සලකා බලන සුදුසුකම් දක්වා ඇති බැවින් හා එම සුදුසුකම් සපුරා නොමැති බැවින් පැමිණිලිකාර හිමිනම මෙම උපාධි පාඨමාලාව හැදෑරීමට තෝරාගෙන නොමැති බව ප්‍රකාශ කර ඇත.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මෙම පැමිණිල්ලට අදාලව කැඳවන ලද වාර්තාව අනුව ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමන පශ්චාත් උපාධි පාඨමාලාවන් හා සම මට්ටමෙන් පිළිගන්නා බව ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර විශ්ව විද්‍යාලය විසින් පැමිණිලිකාර හිමිනමගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට පෙර ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමා ඇති අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන පාඨමාලාවක් හා සම තත්ත්වයේ පවතින්නේද යන්න පැහැදිලි කර ගැනීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදුකර ගැනීමට අවස්ථාව තිබුණ ද එවැන්නක් සිදුකර ඇති බව කරුණු අනාවරණය නොවේ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කළ පශ්චාත් උපාධි පාඨමාලාව පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි පාඨමාලාවක් හා සම මට්ටමින් පිළිගෙන ඇති බැවින් පැමිණිලිකාර හිමිනමට ද එම තත්ත්වය යටතේ අදාල පාඨමාලාවට ඇතුළත් වීමට අවස්ථාව ලබාදිය යුතු වුවද, එය ප්‍රතික්ෂේප කිරීම තුළින් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙනස්කමකට භාජනය කර ඇති බවත්, ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාර හිමිනමගේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බැවින්, මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන පශ්චාත් උපාධි පාඨමාලාවක් හා සම මට්ටමින් සැලකීම හා පැමිණිලිකාර හිමිනමට කොළඹ විශ්ව විද්‍යාලයේ පවත්වන පශ්චාත් අධ්‍යාපනපති උපාධියට ඇතුලත් වීමට අවස්ථාව ලබාදීමට වගඋත්තරකරුවන් විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12.21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- අමාත්‍යතුමා,
උසස් අධ්‍යාපන අමාත්‍යංශය,
නො 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

B/R